122777
300/.

මාතෘකාව:- 19වන සියවසේ බෞද්ධ පුනර්ජීවනය හා

ලංකාවේ ජාතික ව්‍යාපාරයේ

ප්‍රභවය.

(වාදීභසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද

හිමියන්ගේ සේවය)

විභාගය:- 1977 ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (2වැනි වසර)

(ඉතිහාසය)

විභාග අංකය:- SPA 284

විශ්ව විද්‍යාලය:- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,

ගංගොඩවිල, නුගේගොඩ.

CR
954.9302
D 179

122777

## පටුන


පිටු

- ප්‍රස්තාවනාව

- 1 වන පරිච්ඡේදය: ජාතික ව්‍යාපාරය හා ආගමික යටැඟියාව — 1 - 11

  ජාතික ව්‍යාපාරය – ආදිය ජාතික ව්‍යාපාරය
  හා ආගමික සම්බන්ධය – ලංකාවේ මිෂනාරි
  කටයුතු – බෞද්ධ ප්‍රබෝධය – මොහොට්ටි
  වත්තේ ගුණානන්ද හිමි.

- 2 වන පරිච්ඡේදය: මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියෝ — 12 - 27

  චරිත ලක්ෂණ – ගිහි පැවිදි සබඳතා – පැවිදිවීම
  අනුපුර බෞද්ධ තත්වය – වාද විවාදවලට
  සම්බන්ධ පුද්ගලයෝ – අභාවය.

- 3 වන පරිච්ඡේදය: ආගමික වාද විවාදවල තර්ක හා ප්‍රතිඵල — 28 - 57

  බද්දේගම – උදන්විට – ගම්පල – පානදුර–
  වාදවල තර්ක විතර්ක – සිංහල පුවත්පත් සඟරා
  පරමවිඥානාර්ථ සබඳතා – ප්‍රචණ්ඩ ක්‍රියා

- 4 වන පරිච්ඡේදය: සමාලෝචනය — 58 - 63

  වාදිභසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද
  හිමියන්ගේ කාර්යවල ස්වරූපය – සමාජ ආර්ථික
  පසුබිම – ඉතිහාසයේ ලැබෙන තැන. – ජාතික
  ව්‍යාපාරයට සම්බන්ධ වන ආකාරය

- ආශ්‍රිත ග්‍රන්ථ — 64 - 65

## ප්‍රස්තාවනාව

"19වන සියවසේ බෞද්ධ පුනර්ජීවනය හා ලංකාවේ ජාතික ව්‍යාපාරයේ ප්‍රභවය" (වාදිහසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන්ගේ සේවය) යන මාතෘකාව, ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පති (ඉතිහාසය) පරීක්ෂණයේ නිබන්ධන මාතෘකාව ලෙස තෝරා ගැනීමට කරුණු කීපයක්ම හේතුවිය.

ආගමික සබැඳියාව ආසියානු ජාතික ව්‍යාපාර ඉතිහාසයෙහි පොදු ලක්ෂණයකි. ලංකාවටද එය සාධාරණය. කෙසේ වෙතත් 19වන සියවසේ අග භාගයේ ලංකාවේ ඇතිවූ බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය ගැන විස්තරාත්මකව හැදෑරීම් කොට එය ජාතික ව්‍යාපාරයට සම්බන්ධවූ ආකාරය ගැන තවමත් ප්‍රමාණාත්මක ලෙස හදාරා නැත. මෙම කෙටි නිබන්ධනයෙහි එහි එක් පැත්තක් පමණක් පැහැදිලි කිරීමට උත්සාහ ගත්තෙමි. වාදිහසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද චරිතය එහිදි තෝරනු විය.

මොහොට්ටිවත්තේ නැතිනම් මිගෙට්ටුවත්තේ ගුණානන්ද ලෙස උන්වහන්සේගේ නම සඳහන් වේ. මොහොට්ටිවත්තේ ගුණානන්ද යන නම මෙම නිබන්ධනයෙහි සැම විටම වාගේ භාවිතා කිරීමට උත්සාහ ගත්තේ මුල් ලේඛනවල උන්වහන්සේව එම නමින් හඳුන්වා ඇති නිසාය.

මෙම කාර්යයේදි බලපෑ දුෂ්කරතා කීපයකි. පළමුවැන්න මූලාශ්‍ර පිළිබඳ ගැටලුවයි. පැරණි ලේඛන පුවත් පත් සොයා ගැනීම බෙහෙවින්ම අසීරුය. දෙවැන්න කෙටි කලක් තුළ නිබන්ධනය සම්පූර්ණ කිරීමට සිදුවීමයි. මෙම දුෂ්කරතා මග හැරගෙන නිබන්ධනය සම්පූර්ණ කළෙමි.

## 1 වන පරිච්ඡේදය

### 1. ජාතික ව්‍යාපාර හා ආගමික සබැඳියාව

ක්‍රි.ව. පසළොස්වන සියවසේ සිට ආසියා අප්‍රිකා රටවල් බටහිර ජාතීන්ගේ ග්‍රහණයට හසුවිය. දහනවවැනි, විසිවැනි සියවස්වල මෙම යටත් විජිතවල ප්‍රධාන ඓතිහාසික ධාවකය බලවේගය වූයේ ජාතික ව්‍යාපාරවල වර්ධනයයි.

"Nationalism" යන ඉංග්‍රීසි වචනයේ අර්ථය සඳහා 'ජාතිවාදය' ජනපාලවාදය ජාතික වාදය' යන සිංහල වචන යෙදී තිබේ. ලංකාව වැනි බහුජාතික හා විවිධ ආගමික කණ්ඩායම් වලින් යුත් රටක ජාතිවාදය යනු නිශ්චිත නිර්වචනය කිරීම දුෂ්කරය.[1] එහෙත් තත්කාලීන ආසියා අප්‍රිකා රටවල වර්ධනය වූ ජාතික ව්‍යාපාරවල මූලික හරය වූයේ යටත් විජිත භාවයෙන් මිදී විමුක්තිය ලබාගැනීමටයි.[2] ඒ ඒ රටවල සුවිශේෂ ඓතිහාසික ප්‍රවනතාවයන්ට අනුකූලව ජාතික ව්‍යාපාරවල අරමුණු හා උපක්‍රමවල විවිධතා හා වෙනස්කම් ඇතිවිය. සමස්ථයක් ලෙස මෙම අවධිය විමසන විට ජාතික ව්‍යාපාරවල ඉතිහාසය ප්‍රධාන යුග තුනකට බෙදිය හැකි බව ඉතිහාසඥයන්ගේ මතයයි.[3]

1. ප්‍රාථමික විරෝධී ව්‍යාපාර.
2. විරෝධී ව්‍යාපාර.
3. නූතන ජාතිවාදය.

සාම්ප්‍රදායික සමාජයීය සංවිධානයන්ගෙන් විදේශීය පාලකයන්ට විරුද්ධව එල්ලවන අසංවිධානාත්මක ව්‍යාපාර ප්‍රථම අවධියයි. ක්‍රි.ව. 1848 දී බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව උඩරට ඇතිවූ කැරැල්ල හා ක්‍රි.ව.1857-58 ඉන්දීය මහ කැරැල්ල ප්‍රථම අවස්ථාවට නිදසුන් ලෙස දැක්විය හැකිය. දෙවන යුගයේදී වෙළඳ සංගම්, දේශපාලන සංවිධාන, විනශ්චවාදී ස්වරූපයෙන් ඉදිරිපත් කරන විරෝධ සඳහන් වේ. ක්‍රි.ව.1882 ලංකා කාර්මිකාර්මික සංවිධානය 1888 ලංකා ජාතික සංවිධානය වැනි සංගම් ඉදිරිපත් කරන විරෝධ ඊට නිදසුන්ය. ඊළඟ යුගය දේශපාලන පක්ෂ විසින් මෙහෙයවන නූතන ජාතික ව්‍යාපාරයයි.

---

1. දේශපාලනය හා සමාජ දර්ශනය, පිටු 104 ආචාර්ය විශ්වා වර්ණපාල ප්‍රගති මුද්‍රණ ශිල්පියෝ කොළඹ 1979.
2. දේශපාලන දාර්ශනය හා සංවර්ධනය, මාලි පරිවර්තනය 15 පිටු 43 (යටත් විජිත වාදී මහා ජලගැල්මට පසුව පීටර් වොර්ස්ලි") 1975.
3. University of Ceylon, History of Ceylon, Vol. 3 P.249

මෙම ඉතිහාසය මුළුල්ලේම ආගමික සබැඳියාව දෘශ්‍යමාන වෙතත් මෙම නිබන්ධනයේ අවධානය යොමු වන්නේ ක්‍රි.ව.19 වන සියවසේ අවසාන භාගයේදී දිවයිනේ වර්ධනය වූ බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය පිළිබඳවය. එහිදීත් විශේෂ අවධානය යොමුවන්නේ මෙම කාර්ය සංසිද්ධියේදී වාදිභසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන්ගේ කාර්යභාරය පිළිබඳවය.

යටත්විජිතබවට පත්වූ බොහෝ ආසියා-අප්‍රිකා රටවලට ඈත අතීතයට දිවෙන ශ්‍රී විභූතිමත් ඉතිහාසයක් හිමිව තිබුණි. ඉන්දිය ඉතිහාසය ක්‍රි.ව.3000 දක්වා ඈතට විහිදෙන අතර ලංකා ඉතිහාසය වර්ෂ දහස් ගණනක් ඈතට දිවේ. එහෙයින්ම සංස්කෘතික හා භාෂාත්මක වශයෙන් වර්ධනය වූ සම්ප්‍රදායයන් මෙම රටවලට උරුමවූ අතර එම ප්‍රෞඪ අතීතය දෙස ආපසු බැලීම ජාතික හැඟීම් උත්පාදනයට හේතුවේ.

යටත් විජිත පාලකයන් එම ප්‍රදේශවල අනුගමනය කළ ආර්ථික, අධ්‍යාපන, ප්‍රතිපත්තීන් නිසා දේශීය ධනපති පන්තියක් ඒ ඒ රටවල උපත ලැබීය. ඉන් එක් කොටසක් බටහිර සංස්කෘතිය ආධානග්‍රාහීව වැළඳගත් අතර, අනික් කොටස යටත් විජිතවාදීන්ගේ ආගම්වලට හා බටහිර සංස්කෘතියට විරුද්ධ වූහ. දේශීය සංස්කෘතික හා ආගමික පුනර්ජීවනය මතුවන්නේ එම පංතිය තුළිනි. ඔවුහු ආගමික හා සංස්කෘතික මාධ්‍යයෙන් තම කළකිරීම් ඉදිරිපත් කිරීම ජාතික හැඟීම් පොදුජනයා අතර ප්‍රචලිත කිරීමට හේතුවිය.

> " විජිතවාදී පාලනය යටතේ වූ මුස්ලිම් රටවල දේශපාලන විරෝධය දැක්වීමේ ආදිම ව්‍යාපාරය ආගමික නව ජීවනය සමග සම්බන්ධ විය. උතුරු අප්‍රිකාවේ ප්‍රංශ දේශපාලන ආධිපත්‍යයට හා අප්‍රිකානුන් ශිෂ්ටාචාර කිරීමේ දූතමෙහෙයට විරුද්ධව සටන් කරන ලද්දේ ප්‍රබල ඉස්ලාම් පුනරුත්ථාපනයක් මගිනි. සුඩානයෙහි මාධි නම් වූ ආගමික ශාස්ත්‍රවරයෙක් 1885 දී කැරැල්ලක් මෙහෙය විය. බ්‍රිතාන්‍ය හමුදාව විසින් එය මර්ධනය කරන ලදි. ඉන්දුනීසියාවෙහි ඉස්ලාම් ධර්මයට නවජීවනයක් දීමත් මිත්‍යාදෘෂ්ටිකයනට විරුද්ධව නිතර නිතර ජිහාද් යුද්ධ ප්‍රකාශ කිරීමත්, ඕලන්ද පාලනයට විරුද්ධව සටන් කිරීම සඳහා පාවිච්චි කළ ආදිම ක්‍රමවලින් සමහරෙක්. චීනයෙන් හා ඉන්දියාවෙන් ද මෙබඳු නිදසුන් දැක්විය හැකිය.[4]

---

4. ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම, පිටු 30. ආචාර්ය කුමාරි ජයවර්ධන. (පරිවර්තනය ප්‍රේමලාල් කුමාරසිරි) වෙස්ලි මුද්‍රණාලය 1973.

19වන සියවසේ ඉන්දියාවේ ක්‍රිස්තියානි මිෂනාරි අභියෝගයට විරුද්ධව හින්දු පුනර්ජීවනය ඇතිකිරීමේදී, ප්‍රමුඛත්වය ගත්තේ ඉංග්‍රීසි උගත්, හින්දු මධ්‍යම පංතික පුද්ගලයෝය.[5] මෙම ව්‍යාපාරයේ ප්‍රමුඛයා වූයේ රාම් මෝහන් රෝයිය. (1772-1883) ක්‍රිස්තියානි ප්‍රචාරයට අභියෝගයක් ලෙස මෙම ව්‍යාපාරය මුලින්ම හටගත්තේද මුලපටන්ම ඉංග්‍රීසින් සම්බන්ධතා පැවැත්වූ බෙංගාල ප්‍රදේශය ආශ්‍රය කරගෙනය. අනතුරුව ස්වාමි විවේකානන්ද, ස්වාමි දයානන්ද ආදීන්ගේ නායකත්වයෙන් හින්දු පුනර්ජීවන ව්‍යාපාරය පන්ජාබය වැනි ප්‍රදේශවලින් මතුවෙයි. මරාට නායක ලාල් ගංගාධර් තිලක්, අරවින්ද ඝෝෂ්, මහත්මා ගාන්ධි, වැනි ජාතික ව්‍යාපාරයේ පුරෝගාමීහුද හින්දු පුනර්ජීවනයේ ආභාසයෙන් උදම්වූහ.

නව ඉන්දියාවේ නිර්මාතෘවරයා ලෙස සැලකෙන රාම් මෝහන් රෝයි බ්‍රාහ්මණ කුලයක උපත ලබා දැඩි හින්දු භක්තිකයෙකු ලෙස ඇතිදැඩි විය. ඔහු අරාබි, පර්ශියන් භාෂාවල ප්‍රවීණයෙකුසේම, ඉංග්‍රීසි භාෂාවද හදාළේය. එසේම ක්‍රිස්තු ධර්මය හොඳින් තේරුම් ගැනීම සඳහා හීබෲ භාෂාවද ඉගෙනගෙන තිබුණි. මෙම ගුණය යුරෝපීය ලිබරල්වාදී චින්තනයෙන් පෝෂණය විය. සමහර උගතුන් ඔහු චාධාත්ම ආභාසය ලැබුවේ ක්‍රිස්තු ධර්මයෙන්යැයි සඳහන් කරති. ඔහුගේ කෘතිවලින් ක්‍රිස්තු ධර්මය නව පිළිවෙලකට විවරණය කර ඇත.( The Precepts of Jesus, The Guide of Peace and happiness) ඔහු ක්‍රිස්තු ආගම ප්‍රතික්ෂේප කළේය.

ඔහු ඉදිරිපත් කළ "බ්‍රහ්ම සමාජය" පිළිබඳ සංකල්පයෙන් මෙ අදහස් තවදුරටත් සනාථ කළ හැකිය. ආචාර්ය කේ.එම්.පනික්කාර් බ්‍රහ්ම සමාජයක පිළිබඳව කරන නිර්වචනය මෙසේය.

" ඔහු ආරම්භ කළ හින්දු ආගමේ නව සංශෝධිත න්‍යායක් බ්‍රහ්ම සමාජය මගින් ගේ විවරණය කිරීමට උත්සාහ කළේය. නිතර සඳහන් කර ඇති

පරිදි මේ සමාජයේ සාරය ක්‍රිස්තු ආගම හා මිශ්‍ර කරන ලද හින්දු ආගමක් නොව යුරෝපා ප්‍රබුද්ධත්වයේ ධර්මයන් උපනිෂද් කෘතීන්හි වූ
7 අදහස් සමග සංයෝග කිරීමක් විය. ආගමක් වශයෙන් බ්‍රහ්ම සමාජය නියම හින්දු සම්ප්‍රදායේ වේදාන්තමතය හොඳින් පදනම් කරගෙන තිබිණ. එහෙත් එහි වූ ජීවන දෘෂ්ටිය ක්‍රිස්තු හෝ හින්දු ගෝ නොව යුරෝපීය විය. ඒ හි සඳහා ආභාසය ලැබුවේ දහඅටවන සියවසෙහි පැවති බුද්ධිවිෂයක ව්‍යාපාරවලිනි."[6]

---

5. ආසියාවේ බටහිර ආධිපත්‍ය, පිටු 271. ආචාර්ය කේ.එම්.පනික්කාර්. අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව. 1968.
6. ආසියාවේ බටහිර ආධිපත්‍ය, පිටු 273. ආචාර්ය කේ.එම්.පනික්කාර්.

මෙයින් පැහැදිලි වන්නේ හින්දු මුස්ලිම් යන කවර පදනමක සිට ක්‍රියාත්මකවූවද, අලුතෙන් යුරෝපයෙන් ලද දැනුමෙන් ඒවායේ ප්‍රතිසංස්කරණයක් සිදුකිරීමට උත්සාහ කළ බවය. හින්දු දර්ශනය හා ජනප්‍රිය හින්දු ආගම අතර වූ භේදය නැති කිරීමට වෑයම්කර තිබේ. විවිධ මිථ්‍යා සිරිත් විරිත් කාන්තා තහංචි කුලභේදය බහුභාර්යා සේවනය වැනි හින්දු ආගමේ යල් පැන ගිය සංකල්ප විවේචනය විය. එසේම බටහිර ක්‍රමයට අනුව සමාජයේ හැඩගැස්ම ප්‍රතික්ෂෙප විය. මේ නිසා ක්‍රිස්තියානි මිෂනාරි ව්‍යාපාර අභියෝගයෙන් විස්මිතවූ උගත් හින්දුන්ට බ්‍රහ්ම සමාජය කදිම ප්‍රත්‍යුත්තරයක් විය. වේදාන්තය පසුබිම් කරගත් දර්ශනය යළිත් නැගී සිටි අතර , රාම් මෝහන් රෝයි ඉන්දියානුවන්ට නවදෘෂ්ටිකෝණයක් සැපයිය. තාගෝර් පවුලේ අයද බ්‍රහ්ම සමාජයේ සමාජිකයෝ වූහ.[7]

පංජාබ් ප්‍රදේශයේ ක්‍රිස්තියානි මිෂනාරි අභියෝගයට පිළිතුර වූයේ ස්වාමි දයානන්දගේ පුනර්ජීවන කටයුතුය.[8] මෙහිදි වඩාත් අවධානය යොමුවිය යුත්තේ ක්‍රි.ව. 1875 අප්‍රියෙල් 10වෙනි දින බොම්බායේ දි ඇතිකළ "ආර්ය සමාජය" කෙරෙහිය. දෙවියන් පිළිබඳ දැඩි විශ්වාසය ප්‍රකාශ වූ අතර වේදය දෙවියන්ගෙන් ලැබුණු ඥාන සම්භාරය ලෙස විස්තර විය. "යළිත් වේදය කරා යන්න" යන වාක්‍ය ස්වාමි දයානන්දගේ ජනප්‍රිය ආදර්ශ පාඨය විය. වේදය කියවීම, ශ්‍රවනය, දේව විශ්වාසය වැනි අංගයන්ගෙන් යුත් දශ පනත ආර්ය සමාජයේ මූලික පිළිගැනීමක් වූ අතර , බහුදේවවාදය, පිළිමවන්දනය, කුලවාදය, ළදරු විවාහ ප්‍රතික්ෂේප වී වැන්දඹු විවාහ කාන්තා අධ්‍යාපනය ආදියටද අනුබල දුන්නේය. හින්දු ආගමට හැරවීමේ ව්‍යාපාරයක් දියත් වූ අතර , ආර්ය සමාජ ධර්ම ඉගැන්වීමට "ගුරුකුල" විවෘත විය. විපතට පත්වූවන්ට පිහිට වූ අතර හින්දු පුද පූජා පැවැත්වීය. ස්වාමි දයානන්දගේ හින්දු පුනරුදය වඩාත් ආක්‍රමණශීලී මූලක් වූ බව ඉතිහාසඥයන්ගේ මතයයි.

7. ලෝක ඉතිහාස සාරය, පිටු 480. ජවහර්ලාල් නේරු (පරිවර්තනය ඩේවිඩ් ධර්ම කීර්ති) ගුණසේන සහ සමාගම.

8. සිංහල විශ්ව කෝෂය, 4වන කාණ්ඩය. පිටු 661.

හින්දු පුනරුදයේ ජනප්‍රිය දේශකයා වූයේ ස්වාමි විවේකානන්දය. බෙංගාලයේ ජනප්‍රිය යෝගියෙකු වූ රාම ක්‍රිෂ්ණගේ ප්‍රබල ආභාෂයට ලක්වූ විවේකානන්ද බටහිර අධ්‍යාපනයෙන් ලැබූ ඥානය හා ඇමරිකාව, බ්‍රිතාන්‍ය වැනි රටවල කල සංචාරයන්ගෙන් ලද අත්දැකීම් ද පදනම් කරගෙන හින්දු සමාජ ධර්ම හා ආගමික මත විශ්ලේෂණය කළේය. කුලභේදය අසරණයන්ට පිහිට නොවීම ඔහුද විවේචනය කළේය. හින්දු ආගම තුළින් ජාතික හැඟීම් වර්ධනය විය. හින්දු පුනර්ජීවන ව්‍යාපාරය තුළින් යල් පැන ගිය හින්දු සමාජ ධර්ම තහන්චි විවේචනය වී සම්ප්‍රදායික ආගමික ඇගැයීම් යළිත් මතුකරමින් ඇතිකළ බලවේගය සමාජයේ විශාල අනුගාමික පිරිසක් දිනාගත්තේය. ජාත්‍යාලවාදී බීජයන් සමාජයේ රෝපණය විය.

19වැනි සියවසේ පුනර්ජීවනය ලබන වේදාන්ත චින්තනයේ විප්ලවීය පරිවර්තනයක් සිදුකළේ භගවත් ගීතාවේ එන දර්ශනයයි. ඉන්දීය ජාතික ව්‍යාපාරය සටන්කාමී දේශපාලන ව්‍යාපාරයක් වීමට එය බලපෑවේය. මෙහි නායකත්වය ගත්තේ බාල් ගංගා ධාර් තිලක්ය.[9] දේශප්‍රේමී ලාල් ගංගා ධාර් තිලක් " ගණපතිනාග " "සිවාජි" යන පැරණි හින්දු උත්සව නැවත ඇති කරමින් ජාතිකාභිමානය වර්ධනය කළේය. 'කේශරී' 'මහාරට්ට' නමැති ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් බ්‍රිතාන්‍ය, පාලනයට විරුද්ධව ප්‍රබල ව්‍යාපාරයක් මෙහෙය විය. ස්වරාජ්‍ය ඉල්ලා සිටියේය. මහත්මා ගාන්ධි වැනි ඉන්දීය ජාතික නායකයන්ට මේ බලපෑම ලැබුනි.

ක්‍රි.පූ.3වන සියවසේ සිටම බුද්ධාගම හා දේශපාලනය අතර තිබූ සමීප සම්බන්ධය ශ්‍රී ලංකා ඉතිහාසයෙන් පැහැදිලිවේ. දුටුගැමුණු, වට්ටගාමිනී අභය, ධාතුසේන, දෙවන පරාක්‍රමබාහු වැනි නරපතියන් විදේශීය ආධිපත්‍යට

---

9. කේම්බ්‍රිජ් සංක්ෂිප්ත ඉන්දීය ඉතිහාසය .එච්.ඇම්.ඩොඩ්වෙල් පිටු 1010, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව 1971.

විරුද්ධව මෙහෙයවූ ජාතික විමුක්ති ව්‍යාපාර වලට ජීවය වායුව පිඹින ලද්දේ බෞද්ධ ප්‍රබෝධය තුළිනි. දිවයිනේ දේශපාලන ඒකාබද්ධතාවය ඇතිවීමේදී බෞද්ධ ප්‍රබෝධය , බෞද්ධ උත්පව ප්‍රධාන බලවේගයක් වූ ආකාරය ඉතිහාසඥයෝ විග්‍රහ කරති.[10] "දඹදිව සිට ආ ජනයාට සිංහල පාලකයෝ රජවෙති" යන සංකල්පයත් දළදා පාත්‍ර රාජ්‍ය සංකේතයක් බවට පත්වීමත් මීට සාක්ෂිය. ලංකාවේ පාලකයා රටේ ආරක්ෂකයා මෙන්ම ශාසනයේ භාරකාරයා ලෙසත් සැලකීම පැරණි සම්ප්‍රදාය විය. "බුද්ධාගම ආරක්ෂා කිරීම සඳහා තෝරාගත් ජාතිය සිංහලයින්ය" යන මතය තහවුරුවීම හා දිවයින සුවිශේෂී දිවයිනක් ලෙස නිශ්චිත දේශසීමා වලින් වෙන්වී තිබීම අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාර වලදී තීරණාත්මකව බලපෑවේය.

ක්‍රි.ව. 1505 සිට පෘතුගීසි, ලන්දේසි සහ බ්‍රිතාන්‍ය යටත් විජිතවාදීන් දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ අතර ,ක්‍රි.ව.1796 දී බ්‍රිතාන්‍යයෝ මුහුදුබඩ පළාත්වල හිමිකාරයෝ වූහ. ක්‍රි.ව. 1815 දී උඩරට යටත්වීමෙන් මුළු දිවයිනම බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට පත්විය. පෘතුගීසීන් කතෝලිකාගම ප්‍රචාරය කිරීමට විශාල ප්‍රයත්නයක් දැරූ අතර ලන්දේසීහු රෙපරමාදු ආගම පැතිරවීමට උත්සාහ කළහ. මේ කාලයේදී වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ

10. History of kingship in Ceylon upto the Fourth Century AD. P.118. Dr. Tilak Hettiarachchi, Lake House Investment Ltd. Book Publishers - 1972

ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත කිරීමෙහිලා තද හැඟීමකින් කටයුතු කොළහ. එහෙත් ක්‍රිස්තියානි මිෂනාරි සමාගම් දිවයිනට පැමිණීමත් බ්‍රිතාන්‍ය යටත් විජිත කාර්යාලය තදින් ක්‍රිස්තියානි බලපෑමට ලක්වීමත් සමග මෙම තත්වය වෙනස්විය. බ්‍රිතාන්‍ය යටත් විජිත කාර්යාලයේ උපලේකම් වූද, කැලැප්හැම් නිකායේ ප්‍රබල සාමාජිකයෙකු වූද ජේම්ස් ස්ටීවන්ගේ කාලයේ සිට යටත්විජිත කාර්යාලය ප්‍රබලලෙස ක්‍රිස්තියානි සුජනට හසුවිය.[11] එමනිසා ක්‍රිස්තු වර්ෂ 1837 ස්ටුවර්ට් මැකැන්සි ආණ්ඩුකාරයාගේ සිට බ්‍රිතාන්‍ය පාලකයන් ලංකාවේ ක්‍රිස්තියානි ආගමික ප්‍රචාරයට ප්‍රබල අනුග්‍රහයක් දක්වා ඇත. යටත්විජිත ලේකම් ග්ලේනල්, ස්ටුවර්ට් මැකැන්සි ආණ්ඩුකාරයාට ක්‍රිස්තියානියේ ප්‍රචාරයට අනුබල දුන්නේය. ආගමික ප්‍රචාරය කටයුතු කෙරේ ඍජු අවධානයක් හා එය වැදගත් කාර්යයක් ලෙස සැලකූබව ලිපි ලේඛන වලින් පෙනේ. ඒ සමග බ්‍රිතාන්‍ය මිෂනාරි සමාගම් 6ක් දිවයිනේ ආගමික ප්‍රචාරක කටයුතු වල යෙදී සිටියේය. ක්‍රි.ව. 1812දී බැප්ටිස්ට් සමාගමත්, ක්‍රි.ව. 1814දී වෙස්ලියන් සමාගමත්, ක්‍රි.ව.1816දී චර්ච් මිෂනාරි සමාගමත් ලංකාවට පැමිණ සිටියේය. ඇමරිකන් බෝඩ් මිෂනාරි සමාගම , ගොස්පෙල් මිෂනාරි සමාගම ලංකාවේ කටයුතු ආරම්භ කළේය. ඇමරිකන් මිෂනාරි සමාගමේ කටයුතු ප්‍රධාන වශයෙන් යාපනයේත් බැප්ටිස්ට් සමාගම උතුරේ හා නැගෙනහිර ප්‍රදේශවලත් අනෙක් සමාගම් දිවයිනේ සෑම ප්‍රදේශයකමත් වාගේ කටයුතු පටන් ගෙන තිබුණි. ක්‍රි.ව.1845දී කොළඹ

---

11. ලංකාවේ අධ්‍යාපනය සියවස ප්‍රකාශනය (2) කාණ්ඩය පිට 367

අධ්‍යාපන හා සංස්කෘතික දෙපාර්තමේන්තුව 1969.

ඩිකොෆ් නිලය ඇතිවිය.

ආගමික ප්‍රචාරයේදී මිෂනාරි සමාගම්වල ප්‍රධාන මාධ්‍යයවූයේ අධ්‍යාපනයයි.[12] පෘතුගීසි යුගයේ සිටම පාසැල් ආගමික ප්‍රචාරක මාධ්‍ය ලෙස භාවිතා විය. මිෂනාරි පාසැල් ආරම්භ කිරීම සඳහා රජයෙන් අනුග්‍රහ ලැබුණු අතර ක්‍රි.ව.1833 දී කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වලින් ඉංග්‍රීසිය අධ්‍යාපනයේ මාධ්‍ය වී තිබුණි. රජයේ උසස් නිලතල හා ආර්ථික වරප්‍රසාද ලබාගැනීමට මිෂනාරි අධ්‍යාපන ක්‍රමය හේතුවිය. මිෂනාරි සමාගම් පොත්පත් මුද්‍රණය කරමින් ක්‍රිස්තියානි පූජකවරුන් සිංහල ඉගෙන ගනිමින් ක්‍රිස්තියානි ප්‍රචාරක ව්‍යාපාරය දියත් කල අතර බොහෝ අය රජයේ නිලතල ලබා ගැනීමේ අරමුණින් නව ලබ්ධිය වැලඳ ගත්හ. මේ සමගම ක්‍රිස්තියානි පූජකවරුන් බුද්ධාගමේ මූලික ඉගැන්වීම් අසත්‍ය එවා බව ප්‍රකාශ කරමින් දේශනා පැවැත්වීම බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ තීක්ෂණ අවධානයට යොමු විය.

ආගමික සහන ශීලීත්වය ආසියානු ආගමික ඉතිහාසයෙහි ප්‍රධාන ලක්ෂණයකි. ලංකාවේ ක්‍රිස්තියානි මිෂනාරි ව්‍යාපාරය ඇරඹිය මෙම සහනශීලි බව දැක්මට පුළුවන සමහර බෞද්ධ භික්ෂූන් වහන්සේලා ක්‍රිස්තියානි මිෂනාරීන්ට දේශනා පැවැත්වීමට ස්ථාන පිළියෙල කර දීමෙන් හා බයිබලය සිංහලයට පරිවර්තනය කිරීමට සහාය දීමෙන් පැහැදිලිවේ. උන්වහන්සේලා පුරුදුව සිටියේ තමන්ට සිදුවන අපහසුතා

12. බෞද්ධ තොරතුරු පරීක්ෂණ සභාවේ වාර්තාව පිටු 41.1956.

පෙන්සම් මාර්ගයෙන් රජයට දැන්වීමටය.

එහෙයින් ක්‍රිස්තියානි පූජකවරුන්ගේ අසත්‍ය ප්‍රචාර සමග ක්‍රිස්තියානිය සමග සෘජුව ගැටීමේ අවශ්‍යතාවය උගත් භික්ෂූන් වහන්සේලා වටහා ගත්හ. මෙම ඓතිහාසික අවශ්‍යතාවය ඇළිපුයි ශෙරුන්දේ රේවත, හික්කඩුවේ සුමංගල මොහොට්ටිවත්තේ ගුණානන්ද, පොතුවිල ඉන්ද්‍රජෝති, වස්කඩුවේ ශ්‍රී සුභූති ආදි බෞද්ධ භික්ෂූන් වහන්සේලා ක්‍රිස්තියානි මිෂනාරි විරෝධී ව්‍යාපාරයක් දියත් කරන්නේ.

ක්‍රිස්තියානි මිෂනාරි විරෝධී ව්‍යාපාරය 19වන සියවසේ දිවයිනේ බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ මූලික පදනම වූවාසේම දේශපාලන හා ජාතික පිබිදීමකට එය මග හෙළි කළේය. වාදවිවාද, දේශන, පුවත්පත්, පොත්, අධ්‍යාපනය වැනි ක්ෂේත්‍රවලින් මෙම ව්‍යාපාරය ඉදිරියට ගෙන යන ලදි. අධිරාජ්‍ය විරෝධී අදහස් වල බීජයන් වැසියන් අතර රෝපණයට මෙම ව්‍යාපාරය හේතුවිය. වාදිභසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියෝ ක්‍රිස්තියානි මිෂනාරීන් විරෝධී ව්‍යාපාරයේ මුල් අදියරේහි නායකත්වය ගත්හ. ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මිය මෙසේ සඳහන් කරන්නේ එම නිසාය.

"නවජීවනයේ ප්‍රථම අවධිය වූයේ ලාංකිකයන්ගේ පුරෝගාමීත්වයෙන් බෞද්ධ පාණ්ඩිත්‍ය ප්‍රතිෂ්ඨාපනය කිරීමත්, ආගම පුනරුත්ථාපනය කිරීමටත් දරනලද ප්‍රයත්නයයි මෙම සටන් ව්‍යාපාරයේ ප්‍රමුඛත්වය ගෙන ක්‍රියා කළේ කොටහේනේ පංසලේ වූ, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හාමුදුරුවන් වහන්සේය.'[13]

ආසියාවේ ජාතික ව්‍යාපාර බිහිවීමේදී සාම්ප්‍රදායික ආගමික මතවාද වලින් ලැබූ පෝෂණය ඉතිහාසයේ පොදු ලක්ෂණයකි. එක් අතකින් යටත්විජිත පාලන යුගවලදී දේශීය ආගම්වලට තිබූ ස්ථානය අහිමිවිය. අනික් අතින් ක්‍රිස්තියානි මිෂනාරි ව්‍යාපාර වර්ධනය විය. මෙසේ විවිධ පැතිවලින් දේශීය ආගම් පෙරළීම දේශීය ආගම්වල පුනර්ජීවනයට ඓතිහාසික පසුබිම යොදා කළේය. එය ජාතිකාභිමානය, දේශානුරාගය ඇතිගැන්වීමෙහි ද සාධකයක් විය.

---

13. ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම පිටු 36. ආචාර්ය කුමාරි ජයවර්ධන.

## 2වන පරිච්ඡේදය

## මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියෝ

ඉතිහාසයේ සෑම වීරකතන්දරයක්ම වාගේ විවිධ ජනකථා හා ජනප්‍රවාද වලින් විසිතුරුව ඇත. ආසන්න අතීතයේ විරපුරියෙක්වූ මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන්ගේ චරිතය වටා ගෙතී ඇති ජනප්‍රවාද ඊට කදිම උදාහරණයක්ය. එම විසිතුරු කතන්දර විශ්ලේෂණය කිරීම මාතෘකාවට අදාළ හෙයුවින්, පුරාවෘත්ත හා ජනප්‍රවාද සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීම නොව තත්කාලීන සමාජ ආර්ථික-සික බලවේගයන් පිළිබඳව විමසිලිමත් මනසකින් යුක්තව ඒවායින් අඳවන ප්‍රතිචාරයන් තේරුම්ගෙන ඉතිහාසය විවරණය කිරීම ඉතිහාසඥයාගේ කාර්ය බව හඳුනාගත යුතුය.

ක්‍රි.ව.1880 මැයි 7වනදා දිවයිනට පැමිණි කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කොට් තුමා තම දිනපොතෙහි මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන්ගැන කරන ඇගයීම උන්වහන්සේගේ චරිත ලක්ෂණ තේරුම් ගැනීමට උපකාරීවේ.

" මිගෙට්ටුවත්තේ නොහොත් මොහොට්ටිවත්තේ නම් භික්ෂුවකල

බෞද්ධ භික්ෂූන් වහන්සේ මහා ප්‍රඥ කථිකයෙක්ද කාර්මිකයෙක් නෙත්

ප්‍රබලත්ද පරම ආත්ම විශ්වාසය හා සුපරීක්ෂාකාරී බව ප්‍රදර්ශනය කෙරෙන

පරිපූර්ණ මධ්‍යම ප්‍රමාණයේ දේහයකින් යුත් මැදිවියෙහි සිටි තීරසිවර පුද්ගලයකු අපි දුටුවෙමු එවැනි නවක යෝගී භික්ෂූන් වහන්සේලා අනිකෙකු සමග කථා කරන විට බිමට යොමාගත් නෙත් ඇතුව සිටිම සාමාන්‍ය සිරිත නමුදු සමන්ත ලංකා ගිහි තලයෙහි විහිදීව තම විවාදශීලී ඔහු වාග්මිවරයාවුද මිශනාරීන්ගේ සන්ත්‍රාසයවුද මොහු එවැන්නකුට හොබමනා පරිද්දෙන්ම කථා කරනුයේ මගේ මුහුණ දෙස ඍජුව බලමින්ය. එකවිටක්ම බැලුව පමණින්ම ඔහු තවුසෙකුට වඩා වාදිභසිංහයෙකු බව කෙනෙකුට පෙනී යනු ඇත."[1]

වාදීභසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියෝ ප්‍රබල පෞරුෂත්වයකින් හෙබි නිර්භීත භික්ෂුවක් වූ බව ඕල්කොට් තුමා අත්දැකීමෙන් කරන ප්‍රකාශයෙන් පැහැදිලිය.

මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන්ගේ චරිතය ගැන ලේඛන වල පරස්පර විරෝධතා දක්නට ලැබේ.[2] ක්‍රි.ව. 1823 පෙබරවාරි 9වන දින බලපිටියේ මීගෙට්ටුවත්තේදී සලාගම කුලයට අයත් මල්දෙ ද සිල්වා, ඇසනේරිස් මෙන්ඩිස් යන දෙමාපියන්ට දාව, ලද්දු මිගෙල් මැන්ඩිස් යන නාමයෙන් උන්වහන්සේ උපත ලැබූහ. කුඩා කාලයේ සිටම ගම සමීපයෙහි සිටි ක්‍රිස්තු භක්තික දේවගැති වරුන්

---

1. බෞද්ධ පුනර්ජීවනය උදෙසා ඕල්කට් තුමාගෙන් ලැබුණු පිටුබලය, පිටු 13 ආචාර්ය සද්ධාමංගල කරුණාරත්න, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය 1980.
2. (අ) සම්පාතීනයෙහි බෞද්ධාචාර්යයෝ, පිටු 136. පී. බුද්ධදත්ත හිමි. ගුණසේන සහ සමාගම 1967.
   (ආ) පංච මහා වාදය, පිටු 172 වී. ඇස්. ටම්බන්ද්‍ර. ගුණසේන සහ සමාගම 1970
   (ඇ) සිංහල පුවත් පත් සඟරා ඉතිහාසය 1 කාණ්ඩය පිටු 230 කළුකොඳයාවේ ප්‍රඥාසේකර හිමි. ගුණසේන සහ සමාගම.